# රාජාභිෂේකයේ මූල බීජය හා එහි විකාශනය පිළිබඳව විමර්ශනයක්

ඩී.එම්.ඩී.එම්. දිසානායක[1], ජේ.පී.එන්. දේශානි[2]

ලාංකීය ඉතිහාසය තුළ මානවයා සාමුහිකත්ව යන සංකල්පය හඳුනාගත් දිනයේ සිට ක්‍රමිකව ඉස්මතු වූ සාධකයක් ලෙස "නායකත්වය" හඳුනාගත හැකිය. නායක තනතුර " රජ" තනතුර දක්වා විකාශනය වී නීත්‍යානුකූල ලෙස රාජාභිෂේකය සිදු කරන ආකාරය මෙහිදී දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. එසේ බලන කළ මෙම අධ්‍යයන ප්‍රාථමික හා ද්විතික මූලාශ්‍රය භාවිතයෙන් කරනු ලබන අතර ශ්‍රී ලංකීය ඉතිහාසය තුළ රාජාභිෂේකය යන සංකල්පය ඇරඹීම හා එහි විකාශනය කෙලෙස සිදු වූයේ ද යන්න පිළිබඳ මෙහිදී අධ්‍යයනය කරනු ලැබේ. "අභි"යනු හාත්පස අභිමුඛ අභිලාස යන අර්ථ ගෙන දෙන අතර, "ෂේක"යනු තනතුරට පත් කිරිමේදි හිසට මන්ත්‍ර කියමින් ජලය වැක්කිරීම හා ඔටුන්න පැළඳවීම යන අරුත ගෙන එන්නකි. ඒ අනුව අභිෂේක යනු "දිය ඉසිම, රජ බවට පැමිණවිම" යන්නයි. ලංකාවේ ගෝත්‍රික සමාජය තුළ නායකයා අභිෂේක කරවීමක් පෘථුල ලෙස සිදුවී නොමැත. එසේ නමුත් යම් යම් චාරිත්‍ර විධි සහිතව නායකත්වයට පත්විමක් සිදුවී ඇත. මුල් කාලීන ගෝත්‍රික සමාජයේ නායකයන් තම නායකත්වය ප්‍රදර්ශනය කර ඇත්තේ ආභරණයක් පැළඳීම මඟිනි. එය කලක් ගතවන විට වෙනස් වී නායකයා රිටක් වැනි යමක් අතැතිව සිටි බවට මූලාශ්‍රය තොරතුරු දක්වයි. මහාවංස සාධක අනුව විජය රජු ලංකාවේ දි අභිෂේක ගන්වා ඇති නමුත් ඇතැම් විද්වතුන් එය නොපිළිගනියි. එයට හේතුව කුවේණිය ක්ෂත්‍රිය කාන්තාවක් නොවේය යන්න විද්වත් තර්කයයි. මේ අනුව පෙනීයන කරුණ නම් අභිෂේක ගැන්වීමට ක්ෂත්‍රිය කාන්තාව අනිවාර්ය සාධකයක් වූ බවය. කෙසේ නමුත් ක්‍රි.පු තුන් වැනි සියවසින් පසු ඉන්දිය සම්ප්‍රදාය මිශ්‍රව අභිෂේකය යන්න අරුත ගැන්වීම සමාජ පොදු පිළිගැනීම විය. දෙවනපෑතිස් රජුගේ දෙවනවර කළ මෞර්ය අභිෂේකයේ දී ඉන්දිය ක්‍රමයට චාරිත්‍ර විධි රාශියක් කර තිබේ.එහිදී භාවිත කළ රාජ කකුද භාණ්ඩ පිළිබඳව මූලාශ්‍රයවල සඳහන් වේ. වල්විදුනාව, මිරිවැඩි සඟල, මඟුල් කඩුව, සේසත හා නලල් පටිය යන පංචකකුද භාණ්ඩ උපයෝගී කරගෙන දෙවනපෑතිස් රජු දෙවනවර අභිෂේක ගන්වා ඇත.එපමණක් නොව ගංගා නම් නදියේ ජලයත් කන්‍යා ස්ත්‍රීයත් මේ චාරිත්‍රවිධි අතර ප්‍රමුඛ සාධක වූ බව පෙනෙයි. මහින්දාගමනයට පසුව රජු බෞද්ධයෙකු විය යුතුය යන්න සමාජගතවීම මත අභිෂේක සංකල්පය ඇරඹීමේ සිට කලක් ගතවෙත්ම එහි නොයෙකුත් වෙනස්කම් සිදු වූ බව පෙනියයි. එසේම සමකාලීන සමාජ තත්ත්වය මත අභිෂේකයට යම් යම් නීති රීති ද එක් වූ ආකාරය හඳුනාගත හැකිය. කෙසේ නමුත් "අභිෂේක" සංකල්පය තුළ හෙළිදරව් වී ඇති ඉතිහාසයට වඩා වැඩි යමක් ගැබ්ව ඇති බව ප්‍රකාශ කළ හැකිය.

ප්‍රමුඛ පද : අභිෂේකය, ඉන්දීය සම්ප්‍රදාය, චාරිත්‍ර විධි, නායකත්වය, රජු

[1 2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.dilshikamadushani96@gmail.com